Department of Education, Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

සතිය -

විෂය - නර්තනය

13 ශ්‍රේණිය

සැකසීම: එම්.පී.ඩබ්.ආර්.මුතුගල
ර/ ගන්කන්ද මධ්‍ය විද්‍යාලය

# I වාරය

නිපුණතාව - 1.0 නර්තනය හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම - 1.1 නර්තන ශක්‍යතා ප්‍රදර්ශනය කිරීමට විවිධ පැනීම් හා කැරකීම් භාවිතා කරයි.

ක්‍රියාකාරකම - 1.1 ශ්‍රී ලාංකීය සාම්ප්‍රදායික නර්තනය හා සබැඳි පැනීම් හා කැරකීම් ඉදිරිපත් කරමු.

ඉගෙනුම් ඵල -

- සාම්ප්‍රදායික නර්තනය හා සබැඳි පැනීම් හා කැරකීම් නම් කරයි.
- පැනීම් හා කැරකීම් වල දී අනුගමනය කළයුතු විධික්‍රම පිළිබඳ විමසයි.
- සාම්ප්‍රදායික නර්තන හා සබැඳි පැනීම් හා කැරකීම් වල සුවිශේෂී ලක්ෂණ විස්තර කරයි.
- නිවැරදි විධික්‍රම අනුගමනය කරමින් පැනීම් හා කැරකීම් ප්‍රදර්ශනය කරයි.
- නර්තන නිර්මාණයේ දී උගත් පැනීම් හා කැරකීම් භාවිතයට ගතහැකි පිළිබඳව අදහස් දක්වයි.

ශිෂ්‍යා කළයුතු කාර්යයන් -

- දේශීය නර්තන සම්ප්‍රදායන් ආශ්‍රිත කැරකිලි පැනීම් ආශ්‍රීත ක්‍රියකාරකම් සජීවීව නැරඹීමට අවස්ථාවන් උදාකර ගන්න.
- එක් එක් සම්ප්‍රදායන්ට අදාල කැරකිලි පැනීම් ආශ්‍රිත රූප සටහන් එක්රැස් කරගන්න.
- එකී කැරකිලි පැනීම් ක්‍රම අභ්‍යාස කිරීමට උත්සාහ ගන්න.

ඉහත ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය ඉගෙනුම් ආධාරක -

- 13 ශ්‍රේණිය නර්තන අතිරේක කියවීම් පොත
- දහඅට වන්නම - සී. ද. එස්. කුලතිලක
- **You Tube** නාලිකාව - **https://youtu.be/tH91KS1QW0Y**

ඇගයීම් -

- පැනීම් හා කැරකිලි වලදී අනුගමනය කළයුතු විධික්‍රම ඉදිරිපත් කරන්න.
- නිවැරදි විධික්‍රම අනුගමනය කරමින් පැනීම් හා කැරකීම් ප්‍රදර්ශනය කරන්න.

පහත ඇගයීම් ද සිදුකරන්න.-

- සති පාසල් කාර්ය පත්‍රිකාව අංක 01 ස්වයං අධ්‍යාපනයට යොමුවන්න.

පසු ක්‍රියාකාරකම් -

- කැරකිලි පැනීම් ආශ්‍රිත තොරතුරු හා ඡායාරූප ඇතුලත් පොතක් නිර්මාණය කරන්න.
- අන්තර් ජාලය හා ඔබ එකතු කරගත් වීඩියෝ සහා ඡායාරූප එකතුවක් තබාගන්න.
- මේ පාඩමට අදාල පසුගිය විභාග ප්‍රශ්නපත්‍ර වල ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.